**නිකවැරටිය ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ සභා අරමුදල් යටතේ සිදුකරන ලද සභාවේ පොදු වෙළඳපොල වැසිකිලිය ඉදිකිරීම් රුදවුම් මුදල් වටිනාකම රු.33,110 ක් 2022 ජුලි 04 ගෙවීම් කර තිබුණද, එය අදාල ගිණුමෙන් ඉවත්කර නොතිබුණි. | ජර්නල් සටහන් අංක 02 මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයන් 04 ක මූල්‍ය ප්‍රකාශ අනුව හා උපලේඛන අතර එකතු වටිනාකම රු.21,975,636 ක වෙනසක් විය. | ජ'නල් සටහන් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුළ බලපත්‍ර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර එම ලැයිස්තුවේ සඳහන් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | සමීක්ෂණ ලැයිස්තුවේ පිළිවෙලට විධිමත්ව ඉදිරියේ දී සිදු කිරීමට සැලසුම් කර ඇති බව. | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.39,728,102 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,538,795 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදාය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමින්) | 2021<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමින්) |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.,000 | රු.,000 | රු.,000 | රු.,000 | රු.,000 | රු.,000 | රු.,000 | රු.,000 |
| වරිපනම් හා බදු | 7,120 | 6,351 | 6,299 | 7,338 | 776 | 5,946 | 2,944 | 3,002 |
| කුලී | 16,712, | 5,849 | 10,994 | 5,768 | 18,348 | 2,747 | | 14,239 |
| බලපත්‍ර ගාස්තු | 1,676 | 509 | 1,562 | 113 | 2,066 | 800 | 600 | 1,465 |
| වෙනත් ආදායම් | 37,965 | | 52,158 | 61 | 36,142 | 1,550 | 24,166 | 11,975 |
| | -------- | ------- | -------- | -------- | -------- | -------- | -------- | -------- |
| එකතුව | 63,473 | 12,709 | 71,013 | 13,280 | 57,332 | 11,043 | 27,710 | 30,681 |
| | ===== | ====== | ====== | ====== | ====== | ===== | ====== | ====== |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟ වරිපනම් ශේෂ අතරින් වසර 3-5 ත් අතර පැරණි ශේෂය රු.1,235,018 ක් ද වසර 05 ට වඩා පැරණි, ශේෂ රු.705,506ක් ද විය. | තවදුරටත් පවතින හිඟ වරිපනම් බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.20,431 හිඟ ශේෂයෙන් රු.2,510 ක් වසර 3-5 ත් අතර ද රු.3,445 ක් වසර 05 ට වැඩා පැරණි ශේෂයක් ද විය. | අක්කර බදු හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ) කුලී** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපොල වෙළඳ සංකීර්ණයෙන්, බස් නැවතුම්පොළ කඩකාමර, ජංගම කුටි වලින් සහ පොදු පහසුකම් කඩ කාමර වලින් රු.2,686,300ක හිඟ බදු කුලී අයවිය යුතුව තිබුණි. | වර්තමානය වනවිට පවතින හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.43,777,250 ක් හා මුද්දර ගාස්තු රු.17,256,977 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 10 ක එකතු වටිනාකම රු.116,639,023 ක් වූ අතර ඉන් රු.1,406,046 ක් වසර 05 ට වැඩි හිඟ ශේෂයන් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ අයිතම 12 ක එකතු වටිනාකම රු.73,351,642 ක් වූ අතර ඉන් වසර 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ තුනක එකතුව රු.1,332,186 ක් විය. | ඉදිරියේදී කඩ කාමර බදු දීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ගිණුම් කඩිනමින් නිරවුල් කරගත යුතුය. |
| (ඇ) | කඩ බදුදීමට පෙර අවශ්‍ය යටිතල පහසුකම් සභාව විසින් සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් පෙර වර්ෂයේද ගිවිසුම්ගත නොවී තිබූ බස් නැවතුම්පල කඩ කාමර 5 කින් සමාලෝචිත වර්ෂය තුළද කිසිදු ආදායමක් සභාව වෙත ලැබී නොතිබුණි. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | යටිතල පහසුකම් සංවර්ධනය කර බදු දේපල වලින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 21 ක් පැවති අතර එම කුළුණුවලට අදාළ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවලට අදාළ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභාව විසින් ප්‍රදේශයේ සංවර්ධනය නව ඉදිකිරීම් හඳුනාගෙන ඒ සඳහා වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | වරිපනම් දේපල නිවැරදිව හඳුනාගෙන ආදායම් උපදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු පොදු ළිං සඳහා ලැබුණු ඉඩම් 29ක් හා සුසාන භූමි 161ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තක්සේරුකරු ගිණුම් තැබීම කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් නඩත්තු කරන සුසාන භූමි 162ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | සභාව සතු සුසාන භූමි 162 ක අයිතිය පවරා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | සුසාන භූමිවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 3.3 නිශ්කාර්ය / ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු පොදු ළිං 100 ක් නළ ළිං 258 ක් පැවති බව ලේඛනවල දක්වා තිබුණද, ඒවායේ පැවැත්ම හා ක්‍රියාකාරිත්වය පිළිබඳ ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොතිබු බැවින් අක්‍රීය මට්මමේ පවතින ළිං පිළිබඳ තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවීය. දළ වශයෙන් පොදු ළිං අතුරින් 40 ක් හා නළ ළිං53 ක් පමණ භාවිතයට නොගන්නා මට්ටමක පැවතුණි. | මේ පිළිබඳව පරික්ෂා කිරීමට 2022.නොවැම්බර්.28 දිනැති ලිපිය මඟින් කමිටුවක් පත්කර ඇති අතර, අක්‍රිය මට්මමේ පවතින පොදු ළිං ඉවත් කර ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 34.5 සිට සියයට 100 දක්වා විචලනයක් වීම හා වියදම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 49 සිට 80 ක විචලනයක් වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | තාත්වික අයවැය පිළියෙල කිරීමට හා එය මත පදනම්ව ප්‍රතිපාදන ප්‍රශස්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ම අනුව සභාව විසින් තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන තිබුණද එම අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී ඉලක්ක අරමුණු මැනිම සඳහා දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කරන බව. | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කරගත යුතුය. |